// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2348/49 - 2023 සැප්තැම්බර් මස 09 වැනි සෙනසුරාදා - 2023.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ වූ දැන්වීම

*මගේ අංකය* : ඩීඑස්ඕ/එච්ඕඑම්/එල්ඒසී/139.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කහතුඩුව ගමේ මැනුම්පති විසින් පිළියෙළ කර ඇති අංක 520037-25-3 සහ 2022.06.28 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 272, 273, 274, 277, 278, 279, 282, 283, 286 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.3146 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි:

01. **කැබලි අංක 272**

ඉඩමේ නම:-; විස්තරය: ඔලබොඩුව ගෘහ; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. සුදාරක සුගතපාල, අංක 718/31, කෝරළඉම, ගෝනපල හංදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0377.

02. **කැබලි අංක 273**

ඉඩමේ නම:-; විස්තරය: ඔලබොඩුව ගෘහ; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ධම්මිකා කොතලාවල, අංක 71/3, දීපංගොඩ, හෝමාගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0540.

03. **කැබලි අංක 274**

ඉඩමේ නම:-; විස්තරය:කිතුල්ගහ මූකලාන; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ඉන්දික සංජීව තෙවරප්පෙරුම, අංක 76, ද සොයිසා මාවත, කෝරළඉම, ගෝනපල හංදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0650.

04. **කැබලි අංක 277**

ඉඩමේ නම:-; විස්තරය: ඔලබොඩුව ගෘහ; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ජී.ජේ. පෙරේරා, අංක 76/ඒ, ද සොයිසා මාවත, කෝරළඉම, ගෝනපල හංදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0006.

05. **කැබලි අංක 278**

ඉඩමේ නම:-; විස්තරය: ඔලබොඩුව ගෘහ; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: ජී.ජේ. පෙරේරා, අංක 76/ඒ, ද සොයිසා මාවත, කෝරළඉම, ගෝනපල හංදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1408.

06. **කැබලි අංක 279**

ඉඩමේ නම:-; විස්තරය: කහතුඩුව මූකලාන; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: හේමචන්ද්‍ර දසනායක ජීවන්ති කුමුදුනී, අංක 352/1, කෝරළඉම, ගෝනපල හංදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0037.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

07. **කැබලි අංක 282**

ඉඩමේ නම:-; විස්තරය: කහතුඩුව මූකලාන; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: හේමචන්ද්‍ර දසනායක තාරක මදුසංක, අංක 352, කෝරළඉම, ගෝනපල හංදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0025.

08. **කැබලි අංක 283**

ඉඩමේ නම:-; විස්තරය: කහතුඩුව මූකලාන; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: හේමචන්ද්‍ර දසනායක චන්ද්‍රා ප්‍රේමසිලි, අංක 352, කෝරළඉම, ගෝනපල හංදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0089.

09. **කැබලි අංක 286**

ඉඩමේ නම:-; විස්තරය: කහතුඩුව මූකලාන; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: හේමචන්ද්‍ර දසනායක ප්‍රේමරත්න, අංක 352/2, කෝරළඉම, ගෝනපල හංදිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0014.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 ඔක්තෝබර් මස 09 වැනි දින පෙරවරු 10.00 ට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 ඔක්තෝබර් මස 02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**බී.ඒ.ඩී. චින්තක,**
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0075

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 4-3/12/2018/ඩබ්එස්/314.
*මගේ අංකය* : 4/1/5/30.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 814 - අකරගන දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නයිලිය ගමේ පිහිටි, කුරුණෑගල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන පිළියෙළ කරන ලද මු.පි.කු. 2526 හි දක්වන රෙග්ලන්ඩ්වත්ත නමැති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0253 ක් වූ පහත සඳහන් මායිම්වලින් දක්වන ඉඩම් කොටස් 02:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: රෙග්ලන්ඩ් වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: අංගගේ සුගත් පෙරේරා, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0167.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: රෙග්ලන්ඩ් වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: අංගගේ සුගත් පෙරේරා, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0086.

ඉහත සඳහන් ඉඩම්වලට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 නොවැම්බර් 15 වැනි දින පෙරවරු 10.00 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 නොවැම්බර් මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මාවෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ඩබ්.එස්.සේනාතිස්ස,**
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2023 සැප්තැම්බර් මස 06 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0076

---

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : කේඩීඑස්/ජීඅයිකේ/4/4/35.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/5/2015/සීඊබී/32.

**ගම්පොල මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියේ ජලාශය, වේල්ල, කඳවුරු භූමිය, ගල්වල ඉදි කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම**

ඉහත ශීර්ෂය යටතේ අංක 2021/32 හා 2017.06.01 දිනැතිව මා විසින් පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් මහ 6618 පිඹුරේ කැබලි අංක 53 හි ප්‍රමාණය පමණක් හෙක්ටයාර් 0.2832ක් ලෙස සංශෝධනය කරන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

**සී.කේ. අමරකෝන්,**
ප්‍රාදේශීය ලේකම්,
ගඟ ඉහළ කෝරළේ,
කුරුඳුවත්ත නව නගරය.

2023 සැප්තැම්බර් මස 05 වැනි දින,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0077

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.